පළාත්අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - චිත්‍ර

සැප්තැම්බර් මාසය 03

ශ්‍රේණිය - 9

ර/කරවිට මධ්‍ය විද්‍යාලය

සැකසුම - එල්. මහේෂ් විජේවර්ධන

| | | |
|---|---|---|
| නිපුණතාවය | - | දේශීය විදේශීය ඓතිහාසික චිත්‍ර මූර්ති කැටයම් හා ගෘහ නිර්මාණ ගෘහ නිර්මාණ කලාවන් හා අනන්‍යතා හඳුනා ගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණය කරණයේ යෙදී භාවිතයට ගනී. |
| නිපුණතා මට්ටම | - | දේශීය සාම්ප්‍රදායික සැරසිලි මෝස්තර භාවිතයෙන් අධ්‍යයනය කරයි |
| ක්‍රියාකාරකමක් | - | කාන්තා රූප ඇතුළත් සම්ප්‍රදායික රූප අධ්‍යනය කරමු |
| පැවරුම | - | පහත කියවීම් පත්‍රිකාව හොඳින් කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න |

## කියවීම් පත්‍රිකාව


- කාන්තා රූප ඇතුළත් සුවිශේෂ සාම්ප්‍රදායික සැරසිලි නිර්මාණ පිළිබඳ ව මෙහිදී අවධානය යොමු කෙරේ.
- සොබාදහමේ සිටින සතෙකු හෝ යම්කිසි භාණ්ඩයක හෝ හැඩය කාන්තා රූප ඇසුරින් සම්පිණ්ඩනය කර ඇත.
- මේවා පාරම්පරික බිතුසිතුවම් හා කැටයම් අතර දක්නට ලැබේ.

### චතුර්නාරි පල්ලැක්කිය



- කාන්තාවන් හතර දෙනෙකුගේ රූ පල්ලැක්කියක (දෝලාවක) හැඩයට සම්පිණ්ඩනය කොට කරන ලද නිර්මාණය චතුර්නාරි පල්ලැක්කිය නම් වේ.
- දළදා මාළිගයේ උඩුමහලේ වියනේ දකුණු පස ඇති සෘජුකෝණාස්‍රාකාර තීරයක චතුර්නාරි පල්ලැක්කියක් නිර්මාණය කර තිබේ.
- ස්ත්‍රී රූප දෙකක් කකුල් පටලවා දෑත් දිගුකොට සිටින ආකාරයක් නිරූපිත ය. පල්ලැක්කිය ඇතුළේ එහි ගමන් කරන නෙළුම් මලක් අතින් ගත් දෙවි කෙනෙකු හෝ බෝසත් කෙනෙකු දැකිය හැකි ය.


## සප්තනාරි පල්ලැක්කිය



- කාන්තාවන් හත් දෙනෙකුගේ රූප පල්ලැක්කියක ආකාරයෙන් සම්පිණ්ඩනය කොට නිර්මාණය කරන ලද සැරසිලි මෝස්තරය සප්තනාරි පල්ලැක්කිය නම් වේ.
- දළදා මාලිගයෙහි මෙම සිතුවම දක්නට ලැබේ.

- පිටුපසට කරකැවී දෑතින් දෙපය අල්ලාගෙන සිටින සේ නිර්මාණය කරන ලද කාන්තා රූප දෙකකින් රෝද නිර්මාණය කර ඇත.
- රථය මුදුනේ ඔටුන්නක් පැලැඳි කාන්තාවක් දෑතින් දෙපසට විහිදෙන සීන මල් දෙකක් දරා සිටී. රථය මැද පත්තිනි දේවිය වැඩ හිඳී.
- මහනුවර දළදා මාළිගයේ චිත්‍ර අතර සප්තනාරී රථය දැකිය හැකි ය.

## නවනාරී කුඤ්ජරය




පවර රුසිරු නුවණෙහි මහිම ඇන්දේ
නොහැර මල් මදා රති යුග පබැන්දේ
රුසිරු ලියෝ නවදෙන ගජතු මැද්දේ
සිහි කර නව නාරි කුඤ්ජරය ඇන්දේ

- නවනාරි කුඤ්ජරය දක්වෙන සිතුවමක් දළදා මාලිගාවේ පිටමාලයේ සිවිලිම මත දක්නට ඇත.

## නාරිලතා මල


- සාම්ප්‍රදායික සැරසිලි මෝස්තර අතර නාරිලතා මල ලියවැලක් වශයෙන් යෙදේ .
- නාරිලතා මල සුකොමළ නාරිදේහය සිත්කලු උඩුකය පිපුණු මලක් ලෙස උඩට නෙරා සිටින සේ යොදා ඇත.
- ආරණ්‍යගත තාපසයන්ගේ ශීලය පවා බිඳීමේ අයස්කාන්ත බලයක් මෙම පුෂ්පය සතු ව ඇති බව පැවසේ.
- නාරිලතා මලෙහි කාන්තා රුවට විචිත්‍ර ලෙස ආභරණ පවා පළඳවා ඇත.
- නාරිලතා මල් සහිත චිත්‍ර රැසක් පුරාණ විහාර දේවාලය ආශ්‍රිත ව හමු වේ.
- ඇම්බැක්ක දේවාලයයේ ලී කැටයම් අතර නාරිලතා මලක කැටයමක් දැකිය හැකි ය.
- දළදා මාළිගයේ ඇඳ ඇති නාරිලතා මල් එකිනෙකට වෙනස් වූ නිර්මාණ සම්පිණ්ඩනයක් වීම විශේෂත්වයකි.





නාරිලතා මල

## පංචනාරී ඝටය



- කාන්තාවන් පස් දෙනෙකුගේ රූප කළයක හැඩයට සම්පිණ්ඩනය කොට කරන ලද නිර්මාණයකි.
- පාරම්පරික කලා කර්මාන්ත අතර බහුල ව දක්නට ලැබෙන මෙම මෝස්තරය ඇත්දත් කැටයම් අතර සුලබ ව දැකිය හැකි ය.
- පංචනාරී ඝටය නම් මෝස්තරය සශ්‍රීකත්වයේ සංකේතයක් වශයෙන් ව්‍යවහාර වන්නට ඇති බව මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා පෙන්වා දෙයි.
- රිදී විහාරයේ දොරට සවි කොට තිබූ ඇත් දතින් කැටයම් කළ පංචනාරී ඝටය ඉතා විශිෂ්ට නිර්මාණයකි.
- මහනුවර දළදා මාළිගය ඇතුළු පෞරාණික වෙහෙර විහාර රැසක පංචනාරී ඝටය සිතුවමට හා කැටයමට නගා තිබේ.

## සප්තනාරී රථය



- කාන්තාවන් හත් දෙනෙකුගේ රූප යොදාගෙන නිර්මාණය කර ඇති රථය සප්තනාරී රථය නමින් හැඳින්වේ.

වගුව සම්පූර්ණ කරන්න

| | සැරසිලි මෝස්තර | නිරූපිත හැඩය | යොදා ඇති කාන්තා රූප ගණන | දක්නට ලැබෙන ස්ථානය |
|---|---|---|---|---|
| 1 | | | | |
| 2 | | | | |
| 3 | | | | |
| 4 | | | | |
| 5 | | | | |
| 6 | | | | |

කියවීම් පත්‍රිකාව ආශ්‍රයෙන් හෝ රූප සටහන් ඇතුළත් කොට කෙටි සටහනක් නිර්මාණය කර සටහන් පොතට ඇතුලත් කරන්න